KPMG

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී

2022 මාර්තු 31 දිනට විගණනය කරන ලද මූල්‍ය වාර්තාව

අදහස :

පිටු අංක 146 සිට 221 දක්වා ප්‍රදර්ශිත වෙනත් පැහැදිලි කිරීමේ සටහන් හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සාරාංශයක් ද ඇතුලුව ගිණුම් ප්‍රකාශවල සටහන් හා එයින් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශ සහ ස්කන්ධයන්හි වෙනස්වීම් පිළිබඳ, වෙනත් විස්තීර්ණ ආදායම් සහ ලාභ අලාභ පිළිබඳ ප්‍රකාශය සහ 2022 මාර්තු 31 දිනට වන මූල්‍යමය තත්ත්වයට අඩංගු සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී (සමාගම) හි මූල්‍ය ප්‍රකාශ (පහත දැක්වෙන අයුරු) අප විසින් විගණනය කර ඇත. අපගේ අදහසට හා මතයට අනුව සමාගමේ පහත දැක්වෙන මූල්‍ය ප්‍රකාශ 2022 මාර්තු මස 31 වන දිනට, සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් සපයාදී ඇති අතර, එසේම ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන් වලට අනුකූලව එම අවසන් වූ වර්ෂය සඳහා ඔවුන්ගේ මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ පිළිබඳවද එලෙසම කිව හැකිය.

අදහසේ පදනම :

අපගේ විගණනය ශ්‍රී ලංකා විගණක ප්‍රමිතීන්වලට අනුකූලව සිදු කර ඇත. ඉහත ප්‍රමිති තත්ත්වයන් යටතේ වන අපගේ වගකීම් අපගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණනය සඳහා වන විගණනයේ වගකීම්වල තවදුරටත් මැනවින් විස්තර කර ඇත. අප, ශ්‍රී ලංකා ගණකාධිකාරී ආයතනයේ චර්යාධර්ම පද්ධතියට "චර්යාධර්ම පද්ධතිය" ට අනුකූලව සමාගමෙන් ස්වායක්තව/ ස්වාධීනව කටයුතු කරන අතර, එම චර්යාධර්ම පද්ධතියට අනුව, අපගේ වෙනත් චර්යා ධාර්මික වගකීම්ද සාර්ථකව සම්පූර්ණ කර ඇත. අපගේ අදහස් හා මතය ප්‍රකාශ කිරීම පදනමක් සැපයීමට අප ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත හා සුදුසු තරමේ වන බව අපගේ විශ්වාසය වේ.

ප්‍රධාන විගණන පදාර්ථ / කරුණු

ප්‍රධාන විගණන පදර්ථ ලෙස සැලකෙන්නේ අපගේ වෘත්තියවේදී විනිශ්චයට අනුව පවත්නා වර්තමාන කාල පරිච්ඡේදය තුළ සමාන්‍ය මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අපගේ විගණයේ ඇති වැදගත්ම සාධකය හා කරුණු වන්නේය. මෙම කරුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අපගේ විගණනය යන සන්දර්භය තුළ අප විසින් ආමන්ත්‍රණය කරනු ලැබ ඇති අතර, ඒවා අපගේ අදහස මුළු ගැන්වීම තුළ එහිලා කටයුතු කර ඇති අතර, මෙකී කරුණු පිළිබඳ වෙනම අදහසක් අප ඉදිරිපත් කර නොමැත.

බලාපොරොත්තු වන ලද ණය අලාභ (අහිමිවීමේ) සඳහා අනුදත් වෙන් කිරීම් ණය හා අත්තිකාරම් ගෙවීම් සහ මූල්‍ය කල්බදු ලැබීම්.

මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා 17 සටහන බලන්න.

අවදානම පිළිබඳ විස්තරය	අපගේ ප්‍රතිචාර
2022 මාර්තු මස 31 වන දිනට සමාගමේ ණය අත්තිකාරම් ගෙවීම් සහ මූල්‍ය කල්බදු ලැබීම් අඩංගු සමාගමේ මුළු වත්කම්වලින් 87% ක් වන අගය රුපියල් බිලියන 26 ක් විය. වාර්තා ගත දිනට බලාපොරොත්තු වූ ණය අලාභ (ECL) හි, තක්සේරු වටිනාකම, සංකීර්ණතාවය හා විනිශ්චයන්හි වඩා ඉහළ අගයක් ගත් රුපියල් බිලියන 1.51 වේ. සමාගමේ ECL හි ආවේණික සහජ සංකීර්ණතාවය සහ මූල්‍ය ප්‍රකාශවල ණය හා ලැබීම් සහ මූල්‍ය කල්බදු ලැබීම්වල ශේෂයන් හි වැදගත්කම හේතුවෙන් බලාපොරොත්තු වූ ණය අලාභ සඳහා වෙන් කිරීම් වල එම ECL ගණනය සඳහා භාවිත කරනු ප්‍රධාන විගණන කාරණයක් වන්නේය. මෙම මොඩල ණය අවදනම්හි කැපී පෙනෙන වැඩිවීම් (SICR) හි තීර්ණායන කිරීම වැනි වෙනත් උපකල්පනයන් සහ බහුවිධ ආර්ථික සිද්ධිදාමවල බලපෑවැත්ම ඇතුලුව ඇස්තමේන්තු සංඛ්‍යාවක් හා දත්ත පිළිබඳ විශ්වාසනියත්වය මත රඳා පවතිනු ඇත. SLFRS9 මූල්‍ය උපකරණ / ලියවිලි ආර්ථික කොන්දේසි තත්ත්ව පරාසයන් පිළිබිඹු කෙරෙන ඉදිරිගාමී පදනම මත ECL (බලාපොරොත්තු වූ ණය අලාභ) ගණනය කිරීම සඳහා සමාගමට අවශ්‍ය වේ. ණය හා කල්බදු ලැබීම්වල ආයෝජන ලිපිගොනුවල නැගී එන ප්‍රවනතා හෝ දන්නා ECL මොඩල සීමා කිරීම් ආමන්ත්‍රණය කිරීම සඳහා පශ්චාත් මොඩල සීරුමාරු කිරීම් සමාගම විසින් සිදු කරනු ලැබේ. ECL ප්‍රතිඵල වලට සමාගම විසින් යොදනු ලබන විනිශ්චය හැක. පශ්චාත් මොඩල සීරුමාරු කිරීම්, ගැලපීම් සහ ආර්ථික සිද්ධිදාම ඇගැයීමේදී අපි වැදගත් හා කැපී පෙනෙන විනිශ්චයක් ලබාදුන්නෙමු. SCIR (ණය අවදනම්වල කැපී පෙනෙන වැඩි වර්ධනය) හඳුනා ගැනීම සඳහා තෝරාගත් සමාගමේ තීර්ණායක ඉදිරිගාමී මාස 12 හෝ ජීවකාල වෙන් කිරීම් වන්නේ නම්, මෙම තීර්ණායක උපමා තීරණය කිරීමේ සමාගමේ ECL ක්‍රමවේදය ඇතුළත ප්‍රධාන විනිශ්චය ක්ෂේත්‍රයන් වනු ඇති අතර, එය එසේ වාර්තාගත වනු ඇත. ගෝලීය COVID - 19 වසංගත තත්ත්වය හා වාර්තමාන අස්ථිර ආර්ථික කොන්දේසි හේතු කොටගෙන ආර්ථික දෘෂ්ඨිපථය සම්බන්ධ උපකල්පනයන් වඩාත් අතිස්ථිර ස්වභාවයක් ගන්නා අතර, එය රජයේ වෙනස් වන සුළු විචල්‍ය ප්‍රතිචාර සමග එක්ව ගන්නා විට ECL (බලාපොරොත්තු වූ ණය අලාභ) ගණනය කිරීමේදී සමාගමට අවශ්‍ය වන විනිශ්චය තීරණවල මට්ටම වැඩි වර්ධනයට කරන අතර, ආශ්‍රිත විගණන අවදනමද වැඩි කරනු ඇත. SLFRS9 හි සමාගමේ යෙදවුම් සම්බන්ධව අනාවරණයන් SLFRS9 ECL ප්‍රතිඵලවලට යොදනු ලබන ද්‍රව්‍යමය ආදනයන් සහ ප්‍රධාන විනිශ්වයන් පැහැදිලි කිරීමේදී වැදගත් තැනක් උසුලනු ඇත.	අපගේ විගණන ක්‍රියාපටිපාටි වලට පහත සඳහන් කරුණු අන්තර්ගතය: අනුමැතිය පිළිබඳ ප්‍රධාන අභ්‍යන්තර පාලනයන් කළමනාකරණය කිරීමේලා මෙහෙයුම් ඵලදයිතාව සැලැස්ම හා ක්‍රියාත්මක කිරීම් තක්සේරු කිරීම හා අවබෝධ කර ගැනීම ණය අධීක්ෂණයක හා සටහන්ගත කිරීම, නිරීක්ෂණය කිරීම. අත්තිකාරම් හා මූල්‍ය කල්බදු ලැබීම සහ දුබලතාවන් සඳහා ප්‍රතිපාදන ගණනය කිරීම/ මැන බැලීම. ප්‍රධාන කළමනාකරණ විනිශ්චයන්හි සාධාරණ බව හා හේතු යුක්ත භාවය සහ ඇගයීම වෙනත් කළමනාකරණ සීරුමාරුකිරීම් ගැලපුම් සහ ප්‍රගාමී/ ඉදිරිගාමී තොරතුරු සඳහා ගැලපුම් වට්ටම් අනුපාත පැහැර හැරීම්වලදී දෙනු ලබන පැහැරවීම් අනාවරණයන් අලාභය පැහැර හැරීම් සම්බන්ධතාව අලාභ/ පාඩු අදියරයන් හඳුනා ගැනීම ඇතුලුව, බලාපොරොත්තු වූ ණය අලාභ (ECL) මොඩල පිළිබඳ උපකල්පනයන් සහ ප්‍රධාන පරාමිතීන් හි උචිතභාවය ඇගයීම ඇතුළුව අලාභ/ පාඩු සඳහා වෙන් කිරීම් තීර්ණය කිරීමේදී කළමනාකාරිත්වය විසින් භාවිතයට ගනුලබන බලාපොරොත්තු වූ ණය අලාභ (ECL) පිළිබඳ විශ්වාසනියත්වය තක්සේරු කිරීම, මෙම කාර්ය කර්තව්‍යයෙහි කොටසක් වශයෙන් රට තුළ පවතින වත්මන් ආර්ථික අස්ථිර භාවය පිළිබඳ සමාගමේ සලකා බැලීම්වල සාධාරණත්වය හා හේතු යුක්තභාවය අපි තක්සේරුවට, ඇගැයීම ලක් කෙළෙමු. මොඩල ආකෘතීන්ට ප්‍රධාන ආදාන යෙදවුම්වල සම්පූර්ණත්වය හා නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම මගින් ප්‍රධාන උපකල්පනයක් සහ මොඩල ආකෘතිමය ක්‍රමවේදය ඇගැයීමට ලක් කිරීම හා වෙනත් උපකල්පනයන්හි උචිතභාවය තක්සේරුවට ලක් කළෙමු. අපි, වර්තමානයේ පවතින ආර්ථික අස්ථාවරභාවයට හා රජයේ ප්‍රතිචාර මගින් හේතු පාදක වන ආර්ථික සිද්ධිදාමයන්හි අතිශය බැරෑරුම් ප්‍රචණ්ඩකාරී වෙනස්වන සුළු බව සැලකිල්ලට ගෙන සුවිශේෂී වශයෙන් අපි එම උපකල්පනයන්හි උචිත බව තක්සේරුකර මොඩලයන්හි ප්‍රධාන ආදාන යෙදවුම්වල නිරවද්‍යභාවය හා සම්පූර්ණත්වය ප්‍රමාණවත් ලෙස පරීක්ෂා කළෙමු. සියලුම ණය සඳහා ණය අලාභ සඳහා වෙන් කිරීම් සහ අත්තිකාරම් සහ මූල්‍ය කල්බදුවල ලැබීම්වල ප්‍රමාණයන් ණය අලාභ සඳහා වෙන් කිරීම්වල නිරවද්‍යභාවය ගණනය කිරීම සත්‍යායනය කර තහවුරු කිරීම සඳහා ප්‍රතිගණනය කිරීම සිදු කළෙමු. අපි ECL මොඩලයේදී භාවිතා කරන ලද උපකල්පනයන් හා ප්‍රගාමී සාර්ව ආර්ථික (මහා) සාධක සඳහා සමාගම විසින් සකස් කරන ලද සීරුමාරු ගැලපුම්වල සාධාරණත්වය හා හේතු යුක්තභාවය ඇගැයීමට අපගේ තොරතුරු තාක්ෂණ (IT) විශේෂඥවරයෙකු යෙදවූයෙමු. අපි ණය හා අත්තිකාරම් මූල්‍ය කල්බදු ලැබීම් සමග කුලී සින්නක්කර ලැබීම් පිළිබඳ කල් ඉක්ම වූ තොරතුරු පිළිබඳ තර්කනය හා ප්‍රසම්පාදනය හා සකස් කිරීම් ඇගයීම හා තක්සේරු කිරීම සඳහා අපගේම තොරතුරු තාක්ෂණ (IT) විශේෂඥවරයා යෙදවූ බව පවත්නා ගිණුම් ප්‍රමිතිවල අනාවරණ අවශ්‍යතා සපුරාලීම ණය හා අත්තිකාරම් සහ මූල්‍ය කල්බදු ලැබීම් වල අපචය (බෙලහීනතාව) පිළිබඳ අනාවරණයන් ඇගයීමට ලක් කිරීම.

තොරතුරු තාක්ෂණ (IT) පද්ධති හා මූල්‍යමය වාර්තා පිළිබඳ පාලනය

අවදානම පිළිබඳ විස්තරය	අපගේ ප්‍රතිචාර
සමාගමේ ව්‍යාපාරයන් විසින් බොහෝ සංකීර්ණ, අන්‍යොන්‍යව රඳ පවතින, තොරතුරු තාක්ෂණ (IT) පද්ධති ඉහළ ගනුදෙනු සංඛ්‍යාවක් සකස් කර වාර්තාගත කිරීම සඳහා යොදගනු ලබයි. තොරතුරු තාක්ෂණ (IT) පද්ධතිවල වෙනස්වීම් හා ප්‍රවේශයන් පාලනය සමාගමේ මූල්‍යමය තත්ත්වයන් හා කාර්ය සාධනය පිළිබඳ සත්‍ය හා සාධාරණ දැක්මක් ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා මූල්‍ය තොරතුරු වාර්තා සටහන් ගත කිරීම කෙරෙහි තිරණාත්මක බලපෑමක් එල්ල කරනු ඇත. මූල්‍යමය ගනුදෙනු සටහන්ගත කිරීම හා වාර්තා කිරීම පිළිබඳව මහත් බලපෑමක් එල්ල කරන නිසාවෙන් තොරතුරු තාක්ෂණ (IT) පද්ධති හා පාලනයන් සමාගමේ IT පාලන පද්ධති ඵලදයි ලෙස මෙහෙයවීම මත රඳා පවතින්නේ කැපී පෙනෙන ලෙස වෙනස් හා විවිධ වන බැවින් අපගේ විගණන එළඹුම පිළිබඳ ප්‍රධාන කරුණක් වනු ඇත.	අපි පොදු ලෙජරයේ හි ශේෂයන් සටහන්ගත කිරීමේදී හා වැදගත් ප්‍රධාන ගනුදෙනු සැකසීමේදී භාවිත කෙරෙන ප්‍රධාන IT (තොරතුරු තාක්ෂණය) යෙදවුම් (පද්ධති) සඳහා තාක්ෂණවේද පාලන පිරිසක් වාතාවරණයක් පරීක්ෂා කිරීම සඳහා විගණන ක්‍රියාපටිපාටිය කාර්ය සාධනය සඳහා අපගේ IT (තො. තා.) විශේෂඥයින් සමග කටයුතු කළෙමු. තාක්ෂණවේද හිතකාමී ව්‍යාපාර සැකසුම් සම්බන්ධ කෙරෙන මෙම පද්ධති ඇතුළත බැඳී පවතින ස්වයංක්‍රිය පාලනයන් පිළිබඳවද පරීක්ෂා කර බැලුවෙමු. අපගේ වැඩිදුර විගණන ක්‍රියාපටිපාටිවල මෙම කරුණුද අන්තර්ගතය : ✻ සැලැස්ම ඇගැයීම ක්‍රියාත්මක කිරීම සහ විශේෂඥයන් මූල්‍ය වාර්තාකරණය මූල්‍යමය දත්ත හා සමග කටයුතු කිරීම සඳහා අදාළ වන හා මූලික වන සියලු ප්‍රධාන IT (තොරතුරු තාක්ෂණ) පද්ධතිවල අඛණ්ඩ සෘජු අවෘත භාවය පිළිබඳ ප්‍රධාන අභ්‍යන්තර පාලනයන් හි ඵලදයිතාවය මෙහෙවීම ඇගයීම. ✻ අවශ්‍ය විට පාලනයන්ට හානි පූර්ණ වන්දි ගෙවීමද ඇතුලුව වැඩසටහන් සහ IT (තො. තා) මෙහෙයුම්වල ප්‍රවේශය වැඩසටහන් සංවර්ධනය හා වෙනස්වීම් පිළිබඳ පාලනයන් සහ සමාගමේ IT සංවිධානය පිළිබඳ පාලන කටයුතුවල රාමුව පරීක්ෂා කර විභාග කිරීම. ✻ දත්ත සම්ප්‍රේෂණය හා දත්ත සංක්‍රමණය තක්සේරු කිරීම හා සමාගමේ අනුකූලතා කටයුතුලට අදාළ පද්ධති ගණනය කිරීම් හා එක්තරා ස්වයංක්‍රියව කළ පාලනයන්හි මෙහෙයුම් ඵලදයිතාවය ඇගයීම මගින් IT (තො. තා.) යෙදවුම් පාලනයන්හි මෙහෙයුම් ඵලදයිතාවය ඇගයීම මගින් IT ක්‍රියාවලියට අදාළ වැදගත් ගිණුම්වල සැලසුම් ක්‍රියාත්මක කිරීම් හා මෙහෙයුම් වලංගුතාවය තක්සේරු කර ඇගයීම. ✻ ව්‍යාපාර අඛණ්ඩතාව කෙරෙහි වැදගත් සැලකිය යුතු බලපෑමක් එක් කරන IT ව්‍යාපෘති මෙන්ම ව්‍යාපාර වර්ගවල හා ගනුදෙනු පරිමාවන් හි සිසු සංවර්ධනයන් සලකා බලමින් ප්‍රධාන මෙහෙයුම් පද්ධතිවල පැවැත්ම හා ස්ථාවරත්වය ඇගයීම. ✻ ආදර්ශ තියැදි පදනම මත ප්‍රවේශ අයිතීන් ප්‍රදානය හා ඉවත් කිරීම පිළිබඳ වාර්තා පරීක්ෂා කර බලමින් අනුමත වාර්තා සටහන් පිරික්සීම මගින් කාර්ය මණ්ඩලයට දෙනු ලබන ප්‍රවේශ හිමිකම් පරීක්ෂා කර බැලීම. ✻ සුවිශේෂ පද්ධති ඇතුළත භාවිත කරන්නන් අතර රාජකාරී කටයුතු වෙන්කර ලබාදීම බලාත්මක කිරීම සඳහා සැලසුම් කළ නිවාරණ පාලනයන් පරීක්ෂා කිරීම.

වෙනත් තොරතුරු

වෙනත් තොරතුරු සඳහා කළමනාකාරිත්වය වගකීම් භාරය දරනු ඇත. වෙනත් තොරතුරුවලට වාර්ෂික වාර්තාවේ අන්තර්ගත තොරතුරු අඩංගු වන අතර, එනමුත් එහිලා අපගේ විගණක වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශ එහි අන්තර්ගත නොවනු ඇත.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අපගේ මතය, වෙනත් තොරතුරුවලට ආවරණය වනු ඇති අතර, එහිදී අපි කිසිදු හා කවර ආකාරයේ තහවුරු කිරීමේ නිගමනයන් ප්‍රකාශ නොකරන්නෙමු.

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අපගේ විගණනයන් සම්බන්ධයෙන් ගත් කළ වෙනත් තොරතුරු කියවීම අපගේ වගකීම වන අතර, එසේ කිරීමේදී වෙනත් තොරතුරු මූල්‍ය ප්‍රකාශ හා සමග, පදර්ථමය වශයෙන් නොගැලපෙන බව හෝ විගණනයේදී විගණනය පිළිබඳව ලබාගත් අපගේ දැනුම හෝ වෙන යම් ආකාරයක දැනුම ද්‍රව්‍යමය ලෙස දුශ්ප්‍රකාශිතව දිස්වීම සලකා බලනු ලැබේ.

අප විසින් වාර්ෂිකව වාර්තාව කියවීමේදී ද්‍රව්‍යමයව අවප්‍රකාශිත වීමක් සිදු වී ඇති බව අප නිගමනය කර ඇත්නම් ඒ බව අප විසින් පාලනය පිළිබඳ බලධාරීන්ට ඒ බව සන්නිවේදනය කිරීම අපගේ කාර්යය භාරය වනු ඇත. මේ හා සම්බන්ධව වාර්තා කිරීමට අපට කිසිවක් නොමැත්තේය.

මූල්‍ය ප්‍රකාශ සඳහා පාලනය භාරව සිටින බලධාරීන්ගේ සහ කළමනාකාරිත්වයේ වගකීම්

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්වලට අනුකූලව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබාදෙන මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පාලනාධිකාරියේ වගකීම වන අතර, එම කළමනාකාරිත්වය තීරණය කරන පරිදි එවන් අභ්‍යන්තර පාලනයක් සඳහා වංචනිකත්වය හෝ ද්වේෂයන් හෝ හේතු කොට ගෙන වුවද පදර්ථමය අවප්‍රකාශ වලින් තොර, මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීම අත්‍යවශ්‍ය සාධකයක් වෙයි. මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේදී සාර්ථක ව්‍යාපාරයක් ලෙස, සමාගම නොකඩවා අඛණ්ඩව පවත්වාගෙන යෑමේ සමාගමේ ශක්‍යතාව ඇගයීම කළමනාකාරිත්වයේ වගකීම වන අතර, අදාළ පරිදි සාර්ථක ව්‍යාපාරයක් ලෙසට පවත්වාගෙන යාමට අදාළ කරුණු හෙළිදරව් කරමින් සහ ගිණුම්කරණයන්හි සාර්ථක ව්‍යාපාර පදනම භාවිත කරමින් සමාගම එක්කෝ ඇවර කිරීමට හෝ (ගනුදෙනු බේරා වසා දැමීමට) වේ. මෙහෙයුම් නවතා දැමීමට සමාගම අදහස් කරන්නේ වී නම් හෝ අදහස් කරන්නේ නම් හෝ ඒ හැර වෙනත් යථාර්ථවාදී විකල්පයක් නොමැති බව සිතන්නේ නම්, ඒ බැව් එහිලා අනාවරණය කර ප්‍රකාශ කළ යුතු වන්නේය. පාලනය පිළිබඳ බලධාරීන් විසින් සමාගමේ මූල්‍යමය වාර්තාවක හෝ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම දැරිය යුතුය.

මූල්‍ය ප්‍රකාශ විගණනය කිරීම සඳහා විගණනකවරුන්ගේ වගකීම

අපගේ අරමුණ වන්නේ, වංචාව හෝ ද්වේෂ හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශ ද්‍රව්‍යමය අවප්‍රකාශ වලින් තොර බව සාධාරණ ලෙස තහවුරු කිරීමක් ලබාගැනීම හා අපගේ මතයද ඇතුළත් වන විගණන වාර්තාවක් නිකුත් කිරීමය. සාධාරණ හා තර්කානුකූල සහතික කිරීමක් යනු ඉහළ මට්ටමේ තහවුරු කිරීමක් හෙවත් සහතික කිරීමක් වන නමුදු එය ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන් (SLAuSs) වලට අනුකූලව විගණනයක් සිදුකිරීම මගින්, එවැන්නක් පවතින විට, ද්‍රව්‍යමය අවප්‍රකාශයක් සෑම විටම හඳුනා ගනු ලබන බවට ඇප සහතිකයක් නොවනු ඇත. අවප්‍රකාශ වංචාවන් හෝ ද්වේෂ මගින් පැන නැගිය හැකි වන අතර, පුද්ගල වශයෙන් එක එකක් වශයෙන් හෝ සමස්ථයක් වශයෙන් ගත් කළ මෙම මූල්‍ය ප්‍රකාශවල පදනම මත ගත් භාවිත කරන්නන්ගේ ආර්ථික තීරණයන් වල බලපෑම් කරනු ලබනැයි සාධාරණව/ හේතු සහගතව බලාපොරොත්තු විය හැකි නම් ඒවා ද්‍රව්‍යමය යැයි සලකා බලනු ලැබේ.

SLAuSs (ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්) වලට අනුකූලව සිදුකරනු ලබන විගණනයක කොටසක් ලෙස අප අපගේ වෘත්තියවේදී විනිශ්චය ක්‍රියාවේ යොදවන අතර, විගණනය පුරාවටම වෘත්තීමය සංශයවාදී බව (සැක සහිත බව) පවත්වා ගෙන ගියෙමු. තවද අප විසින් :

- ✻ වංචාව හෝ ද්වේෂ හේතුවෙන් මූල්‍ය ප්‍රකාශවල ද්‍රව්‍යමය අවප්‍රකාශවල අවදනම තක්සේරු කර හඳුනාගෙන ලැබ ඇති අතර, එම අවදනම්වලට ප්‍රතිචාර වශයෙන් විගණන ක්‍රියාපටිපාටි ක්‍රියාවට නැගුවෙමු. ඒ අතරම අපගේ මති මතාන්තර සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් හා උචිත සාක්ෂි ලබාගත්තෙමු. වංචාව ඵලය කොට ගෙන උපදින ද්‍රව්‍යමය අවප්‍රකාශය, ද්වේෂ කරුණු ගෙන හටගන්නා දෑයට වඩා ඉහළ තලයක පවතින අතර, වංචාවට දුස්සන්ධානය, කූටරචනය චේතනිය ප්‍රමාද ද්වේෂ, අවතිදේශනයන් හෝ අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අධිගාමිත්වයන් අඩංගු වනු ඇත.
- ✻ විගණනයට අදාළව අභ්‍යන්තර පාලනයන් පිළිබඳ අවබෝධයක් ලබාගැනීම විගණන ක්‍රියා පටිපාටිය සැලසුම් කිරීම, උචිත වාතාවරණයක් තුළ සිදු කළ යුතු නමුදු, සමාගමේ අභ්‍යන්තර පාලනය හි, ඵලදයිතාවය පිළිබඳ අදහසක් (මතයක්) ප්‍රකාශ කිරීම සම්බන්ධ අරමුණ සඳහා උචිත නොවනු ඇත.
- ✻ භාවිත කරන ලද ගිනුම් ප්‍රතිපත්ති පිළිබඳ උචිත බව පිළිබඳ උචිත භාවය ඇගැයීම සහ පාලනාධිකාරිය විසින් සිදුකරනු ලබන අදාළ අනාවරණයන් හා ගිණුම්කරණ තක්සේරු කිරීම් (ඇස්තමේන්තු) වල සාධාරණත්වය හා බුද්ධිකභාවය ඇගැයීම
- ✻ ගිණුම්කරණය පිළිබඳ සාර්ථක ව්‍යාපාරයක පදනම මත කළමනාකාරිත්වයේ භාවිතාව පිළිබඳ උචිත බව හා අනුයෝජනය පිළිබඳ අවසාන තීරණයක් ලබාදීම සහ ලබාගත් විගණන සාක්ෂි මත පදනම් වෙමින් සිද්ධීන් හෝ කොන්දේසි තත්ත්වයන්ට අදාළව ද්‍රව්‍යමය අස්ථිරභාවය පැවතිම මගින් සාර්ථක ව්‍යාපාරයක් ලෙස අඛණ්ඩව පැවතීමේ සමාගමේ හැකියාව පිළිබඳව කැපී පෙනෙන සැකයක් හට ගැනීම කෙරෙහි අවසාන තීරණයකට එළඹීම. අප ද්‍රව්‍යමය අස්ථිරභාවයක් පවතින බවට තීරණයක් ගතහොත් අප විසින් අපගේ මතය, විකරණය (වෙනස්) කිරීම සඳහා අපගේ අනාවරණයන් අප්‍රමාණවත් බවට හෝ මූල්‍ය ප්‍රකාශවල අදාළ අනාවරණයන්ට අපගේ විගණන වාර්තාව කෙරෙහි අවධානය යොමු කරවීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, අනාගත සිදුවීම් හෝ කොන්දේසි තත්ත්වයන් සාර්ථකව ව්‍යාපාරයක් ලෙස සමාගම පවත්වාගෙන යාම නිවාණය කිරීම (නතර කිරීම) කෙරෙහි හේතු පාදක වනු ඇත.
- ✻ සමස්ථ ඉදිරිපත් කිරීමක් ලෙස ඇගැයීමේදී සාධාරණ ඉදිරිපත් කිරීමක් සාක්ෂාත් කර ගැනීමට හැකිවන අයුරින් යටින් දිවෙන ගනුදෙනු හා සිද්ධි මූල්‍ය ප්‍රකාශ මගින් නියෝජනය වන බවට සහ අනාවරණයන්ද ඇතුලුව මූල්‍ය ප්‍රකාශවල අඩංගුව ව්‍යුහය හා සමස්ථ ඉදිරිපත් කිරීම් අගයනු ලැබ ඇත.
- ✻ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ මතයක් (19 ප්‍රකාශ කිරීම සඳහා සමාගම ඇතුළත ව්‍යාපාරික කටයුතුවල හෝ අස්ථිත්වයන්හි මූල්‍යමය තොරතුරු පිළිබඳ උචිත හා සුදුසු ප්‍රමාණවත් විගණන සාක්ෂි ලබාගැනීම.
- ✻ වෙනත් කරුණු ද අතරතුර අප විසින් පාලන බලධාරීන් හා සමග, අප විසින්, අපගේ විගණනයේදී, හඳුනාගත්, අභ්‍යන්තර පාලනය පිළිබඳ කිසියම් කැපී පෙනෙන ඌණතාද ඇතුලුව, වැදගත් විගණන සොයා ගැනීම් සහ සැලසුම් කළ විගණන විෂය පථය හා කාල නිර්ණය පිළිබඳව සන්නිවේදනය කළෙමු.

අප විසින් ස්වාධීනත්වය පිළිබඳ චර්යාධර්ම පද්ධතියට අනුකූලව ආචාර ධාර්මික අවශ්‍යතාවයට සරිලන පරිදි ප්‍රකාශයක් සම්පාදනය කර ඇති අතර, අදාළ පරිදි අදාළ ආරක්ෂක ක්‍රියාමාර්ග සහිතව අපගේ ස්වාධීනත්වය ප්‍රමානාත්මකව තහවුරු කෙරෙන වෙනත් කරුණ හා සියලු සම්බන්ධතාවයන් සමග සන්නිවේදනය කළෙමු. එම අදාළ පාලන බලධාරීන් හා සන්නිවේදනය කළ කරුණු අතරින් පවත්නා මෙම වර්ෂය සඳහා මෙම කරුණු මූල්‍ය ප්‍රකාශ එකී වර්ෂය සඳහා විගණනයේදී කැපී පෙනෙන වැදගත් ස්ථානයක් උසුලනු ඇති බවට හා එසේ හෙයින් ප්‍රධාන විගණන කරුණු කාරණාද වන බව අප නිශ්චය කර තීරණය කළෙමු. අපි අපේ විගණන වාර්තාවේ මෙම කරුණු විස්තර කර ඇති පරිදි එකී කරුණක් පිළිබඳ පොදු මහජන අනාවරණයක් සිදුකිරීම නීතිය මගින් හෝ රීති රෙගුලාසි මගින් නිරාවරණය කර, වළක්වා ඇති අවස්ථාවකදී හෝ අතිශය දුර්ලභ වාතාවරණයක් යටතේ එකී සන්නිවේදනයන් සිදුකිරීම පොදු මහජන අභිලාෂයන්ගේ යහපත හා ප්‍රතිලාභ ඉක්මවා යාම සිදුවනු ඇතැයි සාධාරණව හා යුක්ති සහගතව බලාපොරොත්තු වන ප්‍රතිකූල ආනුෂාංගික තත්ත්වයක් හට ගනු ඇතැයි යනුවෙන් අපගේ එම වාර්තාව තුළ එම කරුණු සන්නිවේදනය නොකළ යුතු යැයි නිශ්චය කළෙමු.

වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලිකර ගැනීම් සියල්ල අප ලබාගෙන ඇති අතර, අපගේ විගණන පරීක්ෂාවේදී දිස්වනතාක් දුරට, සමාගම විසින් නිසි හා යෝග්‍ය ගිණුම් සටහන් තබා ගෙන ඇත.

මෙම ස්වාධීන විගණන වාර්තාව අත්සන් කිරීම සඳහා වූ ප්‍රතිඥන (බැඳියා) හවුල්කරුගේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සාමාජිකත්ව අංකය : 3707 වේ.

අත්. කලේ

වරලත් ගණකාධිකාරීවරු
කොළඹ, ශ්‍රී ලංකාව.
2022 මැයි මස 10 වන දින.

සැ. යු.

ඉහත විගණන මතය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කළ මුල් විගණන මතයේ පරිවර්තනයකි. එසේ හෙයින් මෙකී පරිවර්තනයන්හි යම් අසමානතාවයක් හෙවත් විෂමතාවයක් වෙතොත් එහි මුල් ඉංග්‍රීසි පිටපත කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

ආදායම් ප්‍රකාශය

	අවුරුද්දක් අවසානයේ 31 මාර්තු 2022 රු.'000	අවුරුද්දක් අවසානයේ 31 මාර්තු 2021 රු.'000	වෙනස %
පොලී ආදායම	5,113,433	4,428,485	15%
අඩු : පොලී වියදම	1,946,514	1,920,500	(1%)
ශුද්ධ පොලී ආදායම	**3,166,919**	**2,507,985**	**26%**
ශුද්ධ ගාස්තු හා පොලී ආදායම	293,029	236,665	24%
වෙළඳ ආදායම	133	22	505%
වෙනත් මෙහෙයුම් ආදායම්	79,910	48,532	65%
මුළු මෙහෙයුම් ආදායම	**3,539,991**	**2,793,204**	**27%**
අඩු : ණය අත්තිකාරම්වල සාමූහික අගය මත වෙන් කිරීම්	412,726	482,546	14%
ශුද්ධ මෙහෙයුම් ආදායම	**3,127,265**	**2,310,658**	**35%**
අඩු : වියදම්			
කාර්ය මණ්ඩල පිරිවැය	847,224	680,716	(24%)
ක්ෂය හා ක්‍රමක්ෂය	188,693	155,010	(22%)
වෙනත් පරිපාලන හා විකුණුම් වියදම්	845,109	660,444	(28%)
එකතු කල අගය මත බදු පෙර මෙහෙයුම් ලාභය	**1,246,239**	**814,488**	**53%**
අඩු : මූල්‍ය සේවාවන් මත වන එකතු කල අගය මත බදු	287,570	212,687	(35%)
ආදායම් බදු පෙර ලාභය	**958,669**	**601,801**	**59%**
අඩු : ආදායම් බදු	337,529	191,674	(76%)
කාලපරිච්ඡේදය සඳහා ලාභය	**621,140**	**410,127**	**51%**
සාමාන්‍ය කොටසක් සඳහා වන මූලික ඉපැයුම	3.07	2.03	

විස්තීරණ ආදායම් ප්‍රකාශය

	අවුරුද්දක් අවසානයේ 31 මාර්තු 2022 රු.'000	අවුරුද්දක් අවසානයේ 31 මාර්තු 2021 රු.'000	වෙනස %
කාලපරිච්ඡේදය සඳහා ලාභය	**621,140**	**410,127**	**51%**
වෙනත් විස්තීරණ ආදායම්			
ලාභ සහ අලාභ යටතේ වර්ගීකරණය නොවූ අයිතම			
විශ්‍රාමික පාරිතෝෂික සඳහා තක්සේරු අලාභය	(4,346)	(1,105)	293%
විශ්‍රාමික පාරිතෝෂික තක්සේරු අලාභය මත විලම්භිත බදු	1,043	265	294%
කාලපරිච්ඡේදය සඳහා වන මුළු විස්තීරණ වියදම	**(3,303)**	**(840)**	-
කාලපරිච්ඡේදය සඳහා වන මුළු විස්තීරණ ආදායම	**617,837**	**409,287**	**51%**

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	31 මාර්තු 2022 දිනට රු.'000	31 මාර්තු 2021 දිනට රු.'000
වත්කම්		
මුදල් හා මුදල් වලට සමාන දෑ	837,562	1,020,922
බැංකුවේ ශේෂයන්	177,450	60,935
කල්බදු ලැබිය යුතු ගිණුම්	-	-
කුලී පිට සින්නක්කර බදු කුලී ලැබිය යුතු ගිණුම්	12,954,049	13,719,773
ණය සහ අත්තිකාරම්	13,395,955	7,370,771
මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින	41	41
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තුරු පවතින	1,412,979	813,262
අනුබද්ධ සමාගම් වලින් ලැබිය යුතු ශේෂයන්	-	418,492
වෙනත් ණයගැතියෝ සහ ඉදිරියට කල ගෙවීම්	246,507	260,803
විලම්භිත බදු වත්කම්	78,675	5,207
අස්පෘශ්‍ය වත්කම්	69,459	44,414
දේපල පිරියත සහ උපකරණ	444,453	372,602
භාවිත අයිතිය සහිත වත්කම්	645,887	583,989
මුළු වත්කම්	**30,263,017**	**24,671,211**
වගකීම් සහ ස්කන්ධය		
වගකීම්		
ගණුදෙනුකරුවන් සඳහා වෙනත් මූල්‍ය වගකීම්	12,295,391	10,643,164
පොලී සහිත ණය ගැනීම්	10,777,766	7,470,668
කල්බදු වගකීම්	721,891	615,278
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු ශේෂයන්	659,116	586,525
අනුබද්ධ සමාගම් සඳහා ගෙවිය යුතු ශේෂයන්	72,461	455,906
බැංකු අයිරාව	599,909	301,734
වත්මන් බදු වගකීම	260,378	196,222
විශ්‍රාමික පාරිතෝෂික වගකීම	101,458	83,245
මුළු වගකීම	**25,488,370**	**20,352,742**
ස්කන්ධය		
ප්‍රකාශිත ප්‍රාග්ධනය	1,996,444	1,996,444
ප්‍රාග්ධන සංචිත	234,112	203,055
රඳවාගත් ඉපැයීම	2,544,091	2,118,970
මුළු ස්කන්ධය	**4,774,647**	**4,318,469**
මුළු වගකීම් සහ ස්කන්ධය	**30,263,017**	**24,671,211**
හිමිකම මත මූලික ඉපැයුම (රු)	**23.63**	**21.37**

ස්කන්ධය වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

	හිමිකම මත ආරෝපණය කළ			
	ප්‍රකාශිත ප්‍රාග්ධනය රු.'000	ව්‍යවස්ථාපිත සංචිත අරමුදල රු'000	රදවාගත් ඉපැයුම් රු.'000	මුළු ස්කන්ධය රු.'000
2020 අප්‍රේල් 1 දිනට ශේෂය	**1,996,444**	**182,548**	**1,730,190**	**3,909,182**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම				
අදාල වර්ෂය සඳහා ලාභය	-	-	410,127	410,127
වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම				
විශ්‍රාමික පාරිතෝෂික සඳහා තක්සේරු අලාභය	-	-	(1,105)	(1,105)
විශ්‍රාමික පාරිතෝෂික සඳහා තක්සේරු අලාභය මත විලම්භිත බදු	-	-	265	265
වර්ෂය සඳහා අනෙකුත් මුළු විස්තීරණ ආදායම	-		**840**	**(840)**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	-	-	**409,287**	**409,287**
හිමිකම මත කල බෙදාහැරීම්				
සංචිත අරමුදල් සඳහා සංක්‍රාම	-	20,507	(20,507)	-
හිමිකම මත කල බෙදාහැරීම්	-	**20,507**	**(20,507)**	-
2021 මාර්තු 31 දිනට ශේෂය	**1,996,444**	**203,055**	**2,118,970**	**4,318,469**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම				
අදාල වර්ෂය සඳහා ලාභය	-	-	621,140	621,140
අනෙකුත් විස්තීරණ ආදායම				
විශ්‍රාමික පාරිතෝෂික සඳහා තක්සේරු අලාභය	-	-	(4,346)	(4,346)
විශ්‍රාමික පාරිතෝෂික සඳහා තක්සේරු අලාභය මත විලම්භිත බදු	-	-	1,043	1,043
වර්ෂය සඳහා අනෙකුත් මුළු විස්තීරණ ආදායම	-	-	**(3,303)**	**(3,303)**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම	-	-	**617,837**	**617,837**
හිමිකම මත කල බෙදාහැරීම්				
සංචිත අරමුදල් සඳහා සංක්‍රාම	-	31,057	(31,057)	-
			(161,659)	(161,659)
හිමිකම මත කල බෙදාහැරීම්	-	**31,057**	**192,716**	**(161,659)**
2022 මාර්තු 31 දිනට ශේෂය	**1,996,444**	**234,112**	**2,544,091**	**4,774,647**

තෝරාගත් කාර්යය සාධන දර්ශක

දර්ශක	31 මාර්තු 2022 දිනට (විගණනය කළ)		31 මාර්තු 2021 දිනට (විගණනය කළ)	
නියාමන ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාවය	පවතින තත්වය	අවම අවශ්‍යතාවය	පවතින තත්වය	අවම අවශ්‍යතාවය
අවදානම් මත බර තබන ලද වත්කම් වල ප්‍රතිශතයක් ලෙස මූලික ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාව අනුපාතය	15.89%	7.50%	14.34%	6.50%
අවදානම් මත බර තබන ලද වත්කම් වල ප්‍රතිශතයක් ලෙස මුළු ප්‍රාග්ධන ප්‍රමාණාත්මභාව අනුපාතය	21.74%	11.00%	14.34%	10.50%
ඉතුරුම් වගකීම මත වන ප්‍රාග්ධන අනුපාතය	38.83%	10.00%	40.57%	10.00%
මූලික ප්‍රාග්ධනය (පලමු පෙළ ප්‍රාග්ධනය), රු.'000	4,705,189		4,274,056	
මුළු ප්‍රාග්ධන පදනම, රු.'000	6,438,522		4,274,056	
වත්කම් වල ගුණාත්මකභාවය (ණය ආයොජන වල ගුණාත්මකභාවය)				
දළ අක්‍රීය අත්තිකාරම්, රු.'000	1,429,286		1,530,227	
දළ අක්‍රීය අත්තිකාරම් අනුපාතය, (%)	5.19%		6.92%	
ශුද්ධ අක්‍රීය අත්තිකාරම් අනුපාතය, (%)	(0.32%)		1.67%	
මූලික ප්‍රාග්ධන අනුපාතයට ශුද්ධ අක්‍රීය ණය, (%)	(1.78%)		8.16%	
ප්‍රතිපාදන ආවරණ අනුපාතය (CBSL), (%)	66.49%		60.74%	
ලාභදායීත්වය (%)				
පොලී සීමාන්තිකය	62.00%		57.00%	
වත්කම් මත ප්‍රතිලාභය (බදු පෙර)	3.49%		2.55%	
ස්කන්ධය සඳහා ප්‍රතිලාභය (බදු පසු)	13.66%		9.97%	
ආදායම් අනුපාතය සඳහා පිරිවැය	53.00%		54.00%	
නියාමන ද්‍රවශීලතාවය රු.'000				
ද්‍රවශීලතා වත්කම් අවම අවශ්‍යතාවය	1,597,795		721,609	
පවත්නා ද්‍රවශීල වත්කම් ප්‍රමාණය	2,394,483		1,421,007	
රාජ්‍ය සුරැකුම්පත් අවම අවශ්‍යතාවය	1,621,938		366,422	
පවත්නා රාජ්‍ය සුරැකුම්පත් ප්‍රමාණය	1,411,470		801,528	
පවතින ද්‍රවශීල වත්කම් මත අවශ්‍ය ද්‍රවශිල වත්කම් අනුපාතය (අවම අවශ්‍යතාවය 100%)	150%		197%	
බාහිර අරමුදල් මත ද්‍රවශීල වත්කම් අනුපාතය	15.38%		12.09%	
ආයතනික තොරතුරු				
සේවක සංඛ්‍යාව	816		701	
ශාඛා සංඛ්‍යාව	44		40	
සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව	-		11	
උකස් මධ්‍යස්ථාන සංඛ්‍යාව	-		-	
බාහිර ණය ශ්‍රේණිගත කිරීම	A (lka)		A + (lka)	

සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී හි පහත අත්සන් කල **සභාපති**, ප්‍රධාන විධායක නිලධාරී, මූල්‍ය පාලක නිලධාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අනුකූලතා වන අප, පහත සඳහන් දෑ සඳහා සහතික වෙමු.

(1) ඉහත වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිර්දේශ කල ආකෘති හා නිර්වචනයන්ට අනුව සකස් කර ඇත.

(2) ඉහත වාර්තාවන්හි ඇතුලත් තොරතුරු විගණනය කරන ලද, සිංගර් ෆිනෑන්ස් (ලංකා) පී. එල්. සී හි මූල්‍ය වාර්තා වලින් උපුටාගෙන ඇත.

(sgd) අරවින්ද පෙරේරා සභාපති 10/05/2022	(Sgd.) ටී.ඒ. අමරසූරිය ප්‍රධාන විධායක නිලධාරී 10/05/2022	(Sgd.) බී.එස්.ඊ.ටී. ප්‍රනාන්දු මූල්‍ය පාලක නිලධාරී 10/05/2022	(Sgd.) ඕ.ජී.එස්.ඊ. ජයවීර ජ්‍යෙෂ්ඨ කළමනාකරු - අනුකූලතා 10/05/2022

සිංගර් (ශ්‍රී ලංකා) සමාගමෙහි අනුබද්ධිත ආයතනයක් වශයෙන් 2004 අප්‍රේල් 19 වන දින නීතිගත කරන ලද 2011 අංක 42 දරණ මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙතින් බලපත්‍රලාභී මුදල් සමාගමකි. ෆිච් ශ්‍රේණිගත කිරීම 'A (lka)' සමාගම් ලියාපදිංචි අංකය PB 813 PQ
අංක 498, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03. දු. ක: 2100110, 2400400 ෆැක්ස්: 2303715 ඊ-මේල්: financecompany@singersl.com වෙබ්: www.singerfinance.com